විධාන අංක 09

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත**

10 (1) (ආ) (ii) වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 (1) (ආ) (ii) යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්,

2000 අංක 51 දරන සංස්ථාගත කිරීමේ පනත අනුව ස්ථාපනය කරන ලද ආයතනයක් වන සමස්ථ ලංකා ජම්ඉයියතුල් උලමා ආයතනය විසින් ලිඛිත "හලාල්" සහතිකයක් නිකුත් කරනු ලැබුවහොත් මිස, කිසියම් නිෂ්පාදකයෙකු, වෙළෙන්දෙකු හෝ බෙදාහරින්නෙකු "හලාල් " යන පදය හෝ එහි අර්ථය නිරූපනය වන සේ යම් චිත්‍රයක් හෝ සංකේතයක් සහිත ආහාර වර්ග හෝ බීම වර්ග නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, බෙදා හැරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් විධානය කරනු ලැබේ.

ඉහත විධානය වර්ෂ 2007 ජනවාරි මස 01 දින සිට බල පැවැත්වේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

සරත් විජේසිංහ,
සභාපති.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,
අංක 27, වෝක්ෂෝල් වීදිය,
කොළඹ 02.

2006 දෙසැම්බර් මස 13 දින කොළඹ දී ය.

12-837/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.